# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1801/31 – 2013 මාර්තු 14 වැනි බ්‍රහස්පතින්දා – 2013.03.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: එල්ඩී/05/2005/පීසී/481.
4/1/5/13

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිරගන්දාහේ කෝරළේ සුළු කොට්ඨාසයේ, කොට්ඨාස අංක 12 - වැහැර කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ පිහිටි, කුරුණෑගල දිස්ත්‍රික් මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක මූ.පි.කු. 2284 හා 2012.12.24 දිනැති මූලික පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.5908ක් පමණ වූ කැබලි අංක (එක) 01 .

**කැබලි අංක 01**

ඉඩමේ නම: පහලකෙත; විස්තරය: මහජන පොළෙහි රථගාල; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.5908 ක් පමණ

උතුරට: ඇළ, එන්. පී. ලක්ෂ්මන් හිමිකම් කියන පහලකෙත කුඹුර, මූ.පි.කු. 404 හි කැබලි අංක 1 සහ මූ.පි.කු. 957 හි කැබලි අංක 1; නැගෙනහිරට: මූ.පි.කු. 957 හි කැබලි අංක 1 සහ ඩබ්ලිව්. එම්. එස්. අත්තනගොඩ හිමිකම් කියන පහලකෙත කුඹුර; දකුණට: ඩබ්ලිව්. එම්. එස්. අත්තනගොඩ හිමිකම් කියන පහලකෙත කුඹුර සහ ටී. එම්. සිල්වා හිමිකම් කියන පහලකෙත කුඹුර; බටහිරට: ටී. එම්. සිල්වා හිමිකම් කියන පහලකෙත කුඹුර සහ කොළඹ පාර.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මැයි මස 22 වැනි දින පෙ.ව. 9.30 ට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 මැයි මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ආර්. එම්. ආර්. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
කුරුණෑගල.

2013 පෙබරවාරි මස 08 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 – 1124

## ශුද්ධි පත්‍රය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: මො/ආ සං/03/අත්/15.
ඉඩම් අමා. අංකය: එල්ඩී/05/2004/ඊ/84.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* අංක 1611/14 හා 2009.07.22 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රයේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි ඉඩමේ නම යන්නට කරපිංචාගල මූකලාන හෙවත් මුප්පනවැලි වත්ත යන්න ඇතුළත් විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

ජේ. එම්. යූ. කේ. ජයසේකර,
ප්‍රාදේශීය ලේකම්,
මොණරාගල.

2013 මාර්තු මස 01 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මොණරාගල.

03 – 1123

## ශුද්ධි පත්‍රය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: මැ/ආ සං/ඉ/1/1/13/11.
ඉඩම් අමා. අංකය: එල්/03/ජේ/95/එෆ්ආර්/202.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* අංක 1785/32 හා 2012.11.23 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රයේ 7 වැනි වගන්තිය යටතේ ශුද්ධි පත්‍රයේ සඳහන් මාගේ නම කේ. එච්. ඒ. කේ. නිශාන්ත යන ලෙසට නිවැරදි විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

කේ. එච්. ඒ. කේ. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
මැදගම.

2013 මාර්තු මස 01 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මැදගම.

03 – 1125

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.